# දඟකාර වලස් පැංචා



ඩී.එම්. මිනුලි සනුල්යා දිසානායක

# දඟකාර වලස් පැංචා

කතා  : ඩී.එම් මිනුලි සනුල්යා දිසානායක

චිත්‍ර  : ඩී.එම් මිනුලි සනුල්යා දිසානායක

දිනය : 2025.02.08

ISBN  : 978-624-208-423-7

**පිදුම**

සිප් සතර ලබා දෙමින්

ජීවිතය ජයගන්නට මඟ පෙන්වූ

ආදරණීය මහාමායා බාලිකා

විදුහල් මෑණියන්ට

සෙනෙහසින්

පුදන්නෙමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිද්ධිමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ීහෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක කැලෑවක් මැද ලොකු ගුහාවක් තිබුණා. මේ ගුහාවේ වලස් පවුලක් ජීවත් වුණා. වලස් අයියා හරිම කීකරුයි. වලස් මල්ලී හරිම අකීකරුයි. දවසක් වලස් අම්මයි තාත්තයි දුර ගමනක් යන්න ලෑස්ති වුණා.



වලස් දෙමව්පියෝ වලස් පැටවුන්ට අවවාද කරා ගුහාවෙන් එළියට යන්න එපා කියලා. ඊට පස්සේ වලස් දෙමාපියෝ ගමනට පිටත් වුණා. අම්මලා ගියාට පස්සේ වලස් මල්ලී හොරෙන් කැලෑවේ ඇවිදින්න යද්දී වලස් අයියා දැක්කා. “කොහෙද මල්ලී යන්නේ, අම්මලා කියපු දේ ඔයාට මතක නැද්ද?” කියලා වලස් අයියා කිව්වා.



“මට ඔය උපදෙස් වැඩක් නෑ.” වලස් මල්ලි කිව්වා. එයා අයියත් එක්ක තරහා වෙලා ගුහාවෙන් ඈතට ගියා. ටිකක් වෙලා ගිහින් වලස් අම්මයි තාත්තයි ගෙදර ආවා.

.



වලස් අයියා ගෙදර දොරකඩ ඉඳගෙන අඬ අඬා ඉන්නවා අම්මයි තාත්තයි දුරදීම දැක්කා.



“ඇයි පැටියෝ අඬන්නේ” කියලා වලස් අම්මා ඇහුවා.“මල්ලි කියන දේ අහන්නේ නැතුව කැලේ ඇතට ගියා. ආයේ ආවෙ නෑ.” කියලා වලස් අයියා කිව්වා. වලස් අම්මයි තාත්තයි හොඳටම බය වුණා.



ඊට පස්සෙ තුන්දෙනාම මල්ලිව හොයන්න කැලෑවට ගියා. එයාලා වලවල් අස්සෙ බැලුවා, ගස් උඩ බැලුවා, පඳුරු අස්සෙ බැලුවා, අන්තිමට ගඟේ බැලුවා.



අයියෝ වලස් පැංචා ගඟේ ගිලෙනවා. වලස් තාත්තා ඉක්මනට දර කොටයක් අරගෙන පැංචට අල්ල ගන්න කිව්වා.




වලස් පැංචා කොටය අල්ලගෙන ගොඩට ආවා. වලස් අයියට හරිම සතුටුයි.



වලස් අම්ම පැංචට කියලා දුන්නා ආයේ කවදාවත් වැඩිහිටියන්ට අකීකරු වෙන්න එපා කියලා.



ඉතින් වලස් මල්ලි ආයේ කවදාවත් වැඩිහිටියන්ට අකීකරු වුනේ නෑ.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-423-7